# දැන්වීමයි

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - පේරාදෙණිය

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විදුලි ශිල්පී / කාර්මික ශිල්පී / පෙදරේරු / වඩුකරු / යන්ත්‍රාගාර උපස්ථායක / යාන්ත්‍රික ශිල්පී / පස් අඳින යන්ත්‍ර ක්‍රියාකරු / ගබඩාකරු / යන්ත්‍ර ශිල්පී / මී මැසි පාලක / ස්ටුවර්ඩ් / අරක්කැමි / යන්ත්‍ර පරිචාරක / අකුරු අමුණන්නා / පර්යේෂණ උප සහකාර සේවක තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම - 2017

මෙම දෙපාර්තමේන්තුවේ උක්ත තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2017-03-24 වේ.

- **වයස් සීමාව** - අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
- **අධ්‍යාපන සුදුසුකම්** - අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06 කට නොඅඩුව යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (2) සහිතව සමත්ව තිබිය යුතුය.
- **වෘත්තීය සුදුසුකම්** - අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන් හි **NVQ** අවම වශයෙන් දෙවන මට්ටම ලබාගෙන තිබීම හෝ ඒ සමාන වෘත්තීය මට්ටමක් ලබා තිබීම.

මේ සඳහා සකස් කළ උපදෙස් පත්‍රිකාව සහ ආදර්ශ අයදුම්පත්‍රය ලබා ගැනීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ **www.agridept.gov.lk** වෙබ් අඩවිය වෙත පිවිසෙන්න. ප්‍රමාද වී ලැබෙන හා අසම්පූර්ණ හා නියමිත සුදුසුකම් නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තනතුරු කීපයකට අයදුම් කරන්නේ නම් එක් තනතුරකට එක බැගින් වනසේ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2017-03-24 දිනට පෙර. ඉල්ලුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කරමින් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවන ලෙස මෙයින් දන්වමි.

**කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්,**
**පාලන 01 ශාඛාව,**
**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,**
**පේරාදෙණිය.**

**ආචාර්ය ආර්.ආර්.ඒ. විජේකෝන්**
**කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්**

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**
2017-03-03